# <u>රත්නපුර ප්‍රාදේශීය සභාව සතු දේපල බදු ලබා දීම සඳහා ටෙන්ඩර් කැඳවීමයි</u>

රත්නපුර ප්‍රාදේශීය සභාව විසින් වෙවැල්වත්ත මාර්ගයේ මල්වල හන්දියේ ඉදි කර ඇති කඩ කාමරය පෙර ගෙවුම් (key money)බදු කරුවන් තෝරා බදු දීමට රත්නපුර ප්‍රාදේශීය සභාව තීරණය කර ඇති බැවින් පහත සඳහන් කොන්දේසිවලට යටත්ව බදු ගැනීමට අපේක්ෂා කරන බදු ගැනුම්කරුවන්ගේ මුද්‍රා තබන ලද ටෙන්ඩර් අයදුම්පත් **2026.07.14** දින පෙ.ව. **10.00** දක්වා භාරගනු ලැබේ.

★ටෙන්ඩර් අයදුම්පත් නිකුත් කිරීමේ ආරම්භක දිනය:-**2026.07.01** දින පෙ.ව. **8.30** සිට

★ටෙන්ඩර් අයදුම්පත් නිකුත් කිරීමේ අවසාන දිනය :- **2026.07.13** දින ප.ව. **3.00** දක්වා සිදු කෙරේ.

★ ටෙන්ඩර් අයදුම්පත් භාරගන්නා අවසාන දිනය :-**2026.07.14** දින පෙ.ව. **10.00** දක්වා සිදු කෙරේ

★ ටෙන්ඩර් අයදුම්පත් විවෘත කරන දිනය හා වේලාව :-**2026.07.14** දින පෙ.ව. **10.30** ට වේ.

<u>**කොන්දේසි**</u>

01.2026.07.13 වන දින ප.ව. 3.00ට පෙර මෙම කාර්යාලයට පහත උපලේඛනයේ සඳහන් ගාස්තු ගෙවා පිළිගත හැකි ලියවිල්ලක් මගින් අනන්‍යතාව තහවුරු කර ටෙන්ඩර් අයදුම්පත් භාරගත යුතුය.

02. අයදුම්පත් ගාස්තු ගෙවීමේදී මුදලින් ගෙවිය යුතු අතර, මුදල් ඇණවුම් හෝ චෙක්පත් භාර ගනු නොලැබේ.

03. ටෙන්ඩර් අයදුම්පත් සම්පූර්ණ කරන ආකාරය හා ඉදිරිපත් කරන ආකාරය පිළිබඳ උපදෙස් පත්‍රිකාව ටෙන්ඩර් අයදුම්පත සමග නිකුත් කරනු ලැබේ.

04. සභාපති, රත්නපුර ප්‍රාදේශිය සභාව, රත්නපුර යන ලිපිනයට අදාල ටෙන්ඩර්පත් ලියාපදිංචි තැපැලෙන් හෝ කාර්යාලයේ තැන්පත් කර ඇති ටෙන්ඩර් පෙට්ටියට අතින් ගෙනවිත් බහාලීමෙන් ඉදිරිපත් කළ හැකිය.

05. කඩ කාමරය වසර 05ක කාලයක් සඳහා බදු දෙනු ලැබේ.

06. මාසික බදු මුදල රු. 2000.00 ක් වන අතර, සෑම මසකම 10 දින හෝ ඊට පෙර මාසික බදු මුදල ගෙවීමට කටයුතු කළ යුතුය. එදිනට පසු ගෙවීම් කිරීමේදී අදාල මාසයට හා හිඟව ඇති මුදලට හා මාසවලට වෙන වෙනම ප්‍රමාද ගාස්තු 10% (සියයට දහය) බැගින් ගෙවිය යුතුය.

07. තෝරා ගන්නා ටෙන්ඩර්කරු, මාස 06ක කුලියට සමාන මුදලක් ගිවිසුම් ඇප වශයෙන් තැන්පත් කර ගිවිසුමකට එළඹිය යුතුය.

08. ටෙන්ඩර් අයදුම්කරුවන්ට හා ඔහුගේ බලයලත් නියෝජිතයන්ට පමණක් මෙම අවස්ථාව සඳහා සහභාගී විය හැකිය.

09. ව්‍යාපාර බදු/ කර්මාන්ත බදු/ වෙළඳ බලපත්‍ර ගාස්තු වලින් අදාළ බදු මුදල වාර්ෂිකව ගෙවීමටද ගැණුම්කරු කටයුතු කළ යුතුය.

10. ටෙන්ඩර්කරුවන්ට, අදාල දේපල සඳහා එක් ටෙන්ඩර් පෝරමයක් පමණක් ඉදිරිපත් කළ හැකි අතර, කිසියම් අවස්ථාවක එක් අයදුම්කරුවෙක් අදාල දේපල සඳහා ටෙන්ඩර්පත් දෙකක් (02ක්) හෝ ඊට වැඩියෙන් ඉදිරිපත් කර ඇති අවස්ථාවක් උද්ගත වුවහොත්, එම ටෙන්ඩර්පත්වලින් වැඩිම මිළ සඳහා ඉල්ලීම පිළිගෙන ඔහුගේ අනෙකුත් ටෙන්ඩර්පත් ප්‍රතික්ෂේප කරනු ලබයි. එසේම ඊට අදාල ඇප තැන්පත් මුදල ද සභාව සතු කරනු ලැබේ.

11. වරින් වර රජය විසින් හෝ ප්‍රාදේශීය සභාවේ විධි විධාන වලට අනුකූලව විටින් විට පනවනු ලබන බදු මුදල් ගෙවීමටද, බදු මුදල් සංශෝධනයටද බදුකරු එකඟ විය යුතුය.

12. ටෙන්ඩර්පත් ලබාගෙන ටෙන්ඩර් ඉදිරිපත් නොකරන හෝ ටෙන්ඩර් පිළිගෙන ඇප මුදල් නොගෙවා ගිවිසුම් අත්සන් කිරීමට අපොහොසත් වන අයගේ හෝ අවම ලන්සුවට අඩුවෙන් ටෙන්ඩර් ඉදිරිපත් කරන අයගේ හෝ නියමිත වේලාවට පසුව ටෙන්ඩර් ඉදිරිපත් කරනු ලබන අයගේ ටෙන්ඩර් ඇප මුදල් ආපසු ගෙවනු නොලැබේ.

CamScanner

13. ටෙන්ඩර්පත්වල යම් වෙනසක් කරන්නේ නම්, තනි ඉරකින් කපා ටෙන්ඩර්කරු එයට තම කෙටි අත්සන යොදා සහතික කල යුතුය. අසම්පූර්ණ හා අපැහැදිලි, කුරුටු ගා මකා දමා වෙනස් කර ඇති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

14. අදාල දේපල සඳහා විදුලි හා ජල බිල්පත් බදුකරු විසින් ගෙවිය යුතු අතර, විදුලි හා ජලය අවශ්‍ය නම් අදාල දේපලට සීමා වූ මනුවක් මගින් විදුලි හා ජල සම්බන්ධතාව ලබා ගත යුතුය.

15. එමෙන්ම ටෙන්ඩරය ලබා ගන්නා බදුකරු විසින් ම පමණක් ඉහත කී දේපල පවත්වාගෙන යා යුතු අතර, අතුරු බදු කරුවන්ට (තෙවන පාර්ශ්වයකට) අතුරු බදු දීම සපුරා තහනම් වේ.

16. ලංසු අයදුම්පත් නිකුත් කරනු ලබන අවසන් දිනයේ අවසන් මොහොත වන තෙක් රැඳී නොසිට අයදුම්පත් ලබා ගැනීම තුළින් අනවශ්‍ය ගැටළු පැන නැගීම වලකා ගත හැකිය.

17. මෙයට අදාල සියළුම විස්තර සතියේ වැඩ කරන දිනයන්හි පැමිණ හෝ රත්නපුර ප්‍රාදේශීය සභාවේ දුරකථන අංකයට පෙ.ව. 8.30 සිට ප.ව. 4.00 දක්වා කාලය තුල කාර්යාලයෙන් විමසා ලබා ගත හැකිය. (දු.අංක 045-2220098)

18. ටෙන්ඩර් කැඳවීම සම්බන්ධ අවසන් තීරණය රත්නපුර ප්‍රාදේශීය සභාව සතුවේ.

<u>උපලේඛනය</u>

| අනු අංකය | දේපළ නාමය | වර්ග අඩි ප්‍රමාණය | අවම ලංසු මුදල රු. | ආපසු නොගෙවනු ලබන ටෙන්ඩර් පෝරම ගාස්තු මුදල රු. | ආපසු ගෙවනු ලබන ටෙන්ඩර් ඇප තැන්පත් මුදල රු. |
|---|---|---|---|---|---|
| 01. | වේවැල්වත්ත මාර්ගයේ මල්වල හන්දියේ ඉදි කර ඇති කඩ කාමරය | - | 130,000.00 | 2,500.00 | 5,000.00 |

2026 ජූලි මස..25..දින
රත්නපුර ප්‍රාදේශීය සභා කාර්යාලයේදී.එච්.එල්.එන්.මුණසිංහ

.................................................
සභාපති
ප්‍රාදේශීය සභාව
රත්නපුර

එච්.එල්.එන්.මු[illegible]
සභාපති
රත්නපුර ප්‍රාදේශීය සභාව
විද්‍යාල මාවත
නවනගරය, රත්නපුර

CamScanner